

# මුහුදු ගුප්ත කුරුල්ලා 'ඇල්බට්‍රොස්'

**මුහුදු පක්ෂීන් අතර ගුප්ත කුරුල්ලකු සේ සලකන ඇල්බට්‍රොස් (Albatrass) කුරුල්ලන් පිළිබඳ ධීවරයන් සලකනු ලබන්නේ තමන්ගෙන් වෙන් වූ ආත්මය ලෙසට ය. ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ ව්‍යාප්තිය බොහෝ දුරට ඇන්ටාක්ටික් ප්‍රදේශයට ආසන්න ඕස්ට්‍රේලියාව සහ නවසීලන්ත ප්‍රදේශවලට සීමා වී ඇත.**

පෙතී නොපෙතී යත ලෙස අහසේ පියා විදින ඇල්බට්‍රොස් පක්ෂීන් තුළ වූයේ ආකර්ෂණීය දර්ශනයකි. පරිසරවේදීන් විසින් ඇල්බට්‍රොස් පක්ෂි විශේෂ 07 ක් පමණ හඳුනාගෙන ඇත. ඒ සඳහා ඔවුන් පාදක තරගෙන ඇත්තේ මුහුදු වෙරළට ගසා ගෙන විත් තිබෙන මළසිරුර (Corpes) සහ කෞතුකාගාර වර්ගීකරණය ය. ඔවුන්ගේ වර්ගීකරණය අනුව රාජකීය හෝ විශාල ඇල්බට්‍රොස් විශේෂ සහ කුඩා විශේෂ 17 ක් පමණ සිටී.

ඔවුන් ගේ ජීවත්වීමේ ආයුෂ කාලය අවුරුදු 60 ක් පමණ වේ. වෙනත් ලෙසකින් මේ අදහස සරලව කිවහොත් මිනිසෙකුට සමාන ආයුෂ කාලයක් ලැබීමට තරම් ම ඇල්බට්‍රොස් භාග්‍ය වන්ත ය. තමන් ගේ ජීවිතයට හවුල්කරුවකු ද තෝරා ගෙන ජීවත්වන මේ කුරුල්ලා ගේ අබිරහස මුහුදු ජීවිතය ගැන තොරතුරු ගවේෂණය කිරීම අපි සිතන තරමට ම පහසු නැත.

මේ මහත් වූ විශ්වය තුළ 'ඇල්බට්‍රොස් ' පක්ෂියා වෙනුවෙන් ද සීමා වූ පදිංචි ස්ථාන නැතුවාම නොවේ. ඕස්ට්‍රේලියාවට දකුණු දිග 'සිඩ්නි' නගරයට සමීප පැසිපික් සාගර කලාප කොටස මේ කුරුල්ලන් වෙනුවෙන් වූ පදිංචි ප්‍රදේශය. සෑම සිසිර ඍතුවකම දකුණු අර්ධ ගෝලයේ හැසිරෙන ඇල්බට්‍රොස් බිත්තර දැමීමෙන් අනතුරුව මියයන දැල්ලන් ආහාරයට ගනී.

1970 දශකයේ දී පරිසරවේදී ලින්ඩ්සේ ස්මිත් ඔහු ගේ බිරිය ජැනිසි සහ මිතුරන් කිහිප දෙනෙකු සම්බන්ධ වී ඕස්ට්‍රේලියානු ඇල්බට්‍රොස් පක්ෂීන් පිළිබඳ වූ ගවේෂණය වෙනුවෙන් කුරුලු හැසිරීම් පර්යේෂක 'ඩෝ ගිබ්සන්' සමග සම්බන්ධ විය. මේ පර්යේෂණය සඳහා ඔවුන් තෝරාගත් ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ පාද වල මුදු පළඳ මුද හරින ලදි.

අවුරුදු කීපයකින් අනතුරුව එම පරිසරවේදීන්ට ඔවුන් මුදු පැළඳූ ඇල්බට්‍රොස් කුරුලු මිතුරන් යළිත් දැක ගන්නට ලැබුණි. මේ කුරුල්ලන් දකුණු අර්ධ ගෝලයට සීමාවී සිටින්නේය යන මිථ්‍යාව තුළින් පරසරවේදීන්ට මිදීමේ ශක්තිය

**1970 දශකයේ දී පරිසරවේදී ලින්ඩ්සේ ස්මිත් ඔහු ගේ බිරිය ජැනිසි සහ මිතුරන් කිහිප දෙනෙකු සම්බන්ධ වී ඕස්ට්‍රේලියානු ඇල්බට්‍රොස් පක්ෂීන් පිළිබඳ වූ ගවේෂණය වෙනුවෙන් කුරුලු හැසිරීම් පර්යේෂක 'ඩෝ ගිබ්සන්' සමඟ සම්බන්ධ විය. මේ පර්යේෂණය සඳහා ඔවුන් තෝරාගත් ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ පාද වල මුදු පළඳු මුදු හරින ලදි. අවුරුදු කීපයකින් අනතුරුව එම පරිසරවේදීන්ට ඔවුන් මුදු පැළඳූ ඇල්බට්‍රොස් කුරුලු මිතුරන් යළිත් දැක ගන්නට ලැබුණි.**

ලැබුණේ මේ වන විටත් මුදු පැළඳූ කුරුල්ලන් ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල ද කරක් ගසා පැමිණීම නිසාම ය.

අවුරුද්දෙන් අවුරුද්දට ඇල්බට්‍රොස් කුරුලු ගහණයේ අඩුවීමක් දක්නට ලැබුණි. 1986 ට පෙර වර්ෂයේ දී දිනකට පස් වතාවක් මොවුන් පැය ගණනක් මුහුදු ප්‍රදේශයේ හැසිරුන කුරුල්ලන්ගේ (ඇල්බට්‍රොස් ) සංඛ්‍යාව 30 ක් වුව ද 1986 දී එය 12 කට පමණ සීමාවී ඇත.


කේප්හෝන් තුඩුවට ආසන්න යේ බ්‍රිතාන්‍ය දූපත් ආශ්‍රය කර ගත් පරිසර අධ්‍යාපනයේ දී පෙනී ගිය අන්දමට ඇල්බට්‍රොස් කුරුලු ගහණයේ විශාල බිඳ වැටීමක් දක්නට ලැබේ. බිත්තර දමූ කුරුලු කූඩු පවා අතහැර දමා ගොස් ඇත. දහස් ගණනින් වූ ඔවුන් ගේ අතුරුදහන් වීමට නිශ්චිත පිළිතුර පරිසරවේදීන් තවමත් දැන හඳුනාගෙන නැත. මුහුදු පක්ෂීන් පිළිබඳ වූ විශේෂඥයන් සඳහන් කරන අන්දමට ඇල්බට්‍රොස් කුරුලු විශේෂ 24 ක් අතර විශේෂ 21 ක්ම අද වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇත.

ධීවර තාක්ෂණය විසින් අද ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ ජීවත්වීමේ අයිතිය උදුරාගෙන ඇත. හැම දිනක ම මුහුදට ඇදෙන කොකු 3000 ක් පමණ අමුණන ලද කිලෝමීටර් 100 ක් දිගැති ධීවර බෝට්ටු වලට මුහුදු පක්ෂීන් රැවටෙනු ඇත. කොකු කුරුල්ලන්ට පෙනෙන්නේ මාළුන් ලෙසට ය. මාළුන් ගොදුරු කර ගැනීමට පැමිණෙන කුරුල්ලන් ගේ තටු ඉරී යෑම නිසා ඉගිලෙනු නොහැකිව දියේම ගිලී මියයති. ජපානය විසින් ධීවර යාත්‍රා වෙනුවෙන් වර්ෂයකට අමුනණු ලබන මිලියන 108 ක් වූ කොකු වලට ඇමිණී, දක්ෂිණාර්ධ ගෝලය තුළ අහිමිව යන කුරුලු ප්‍රමාණය 44,000 කි. වාර්ෂිකව සිදුවන මෙම ඉහළ අගය කොතරම් ප්‍රබල ද යත් හැම පැයකට ම. ඇල්බට්‍රොස් කුරුල්ලන් 5 දෙනකු මියයන තරමටම ගැටළුව උග්‍රවී ඇත.

මේ ඛේදජනක ඉරණමෙන් ඇල්බට්‍රොස් ඇතුළු මුහුදු කුරුල්ලන් රැකගැනීමට පරිසරවේදීන් විසින් යෝජනා කීපයක් ඉදිරිපත් කොට ඇත.

1. ඉදිරි අවුරුදු තුනක කාලයේදී ධීවර කටයුතු වෙනුවෙන් ටූනා බෝට්ටු යොදා ගැනීම
2. කුරුලු මායිම හඳුනා ගැනීම,
3. නැවේ පිටුපසට සෙලවෙන වාෂ්ප උපකරණ සම්බන්ධ කිරීම,
4. රාත්‍රී කාලයේ දී කුරුල්ලන්ට ඇම හඳුනාගත නොහැකි ලෙසින් ආලෝකය අඩු කිරීම.( මේ තත්ත්වය තුළ කුරුල්ලන් ඇමට බිලිවීම 90 % කින් අඩුකරගත හැකි ය.)

නවසීලන්තය ඇල්බට්‍රොස් පක්ෂීන් ගේ ප්‍රජනන කලාපය වුව ද, ධීවර කර්මාන්තය ආශ්‍රිත තර්ජන නිසා ඔවුන් දකුණු ඇමරිකානු කලාපයට සංක්‍රමණය වුව ද දකුණු දිග මුහුද නිත්‍යානුකූල නොවන ධීවර තාක්ෂණ කටයුතු මගින්



දූෂණය වී හමාර ය. විසිරී පැතුරුන මේ අන්තරාය මගින් කුරුල්ලන් රැකගැනීම සඳහා වූ අධ්‍යයනයේ දී සිය ආත්මාරක්ෂාවට ගැලපෙන ප්‍රදේශ හඳුනා ගැනීමේ අයිතිය කුරුල්ලන්ට ම ලබා දුන්හ.පාදවල සවි කරන ලද චන්ද්‍රිකා සම්ප්‍රේෂණ (Transmiters) සමග මුද හරින ලද ඇල්බට්‍රොස් කුරුල්ලෝ දකුණු ඇමරිකාව හරහා දින හතරක් තුළ බ්‍රසීලයට ගොස් නැවත අත්ලාන්තික් හරහා දින 10 ක් ගත වෙත්ම කේප්ටවුන් ප්‍රදේශයට ළඟා වූහ. මෙල්බෝන් හි, ඩේවිඩ් නිකලොස් සඳහන් කරන අන්දමට ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ සංචරණ වේගය පැයකට කිලෝමීටර් 10 ටත් වඩා ඉහළ ය.

මාස 6 ක කාලය තුළ කිලෝමීටර 75,000 ක දුර පියඹා යන ඇල්බට්‍රොස් කුරුල්ලන් රැක ගැනීමේ වටිනාකම දැන් පරිසරයට ආදරය කරන සියල්ලන් විසින් ම දැන හැඳිනගෙන හමාර ය.

ඒ නිසා ම දෝ එක්සත් ජාතීන් ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය මගින් ධීවර කර්මාන්ත ආශ්‍රිත වූ තාක්ෂණයට ගොදුරු වන කුරුල්ලන් රැක ගැනීමට ක්‍රියාත්මක වන සැලැස්මක් සම්මත කරන ලදි. මේ අනුව දකුණු ජෝර්ජියාව අසල මුහුදු සීමාව තුළ කුරුලු ප්‍රජනනය සිදුවන මාස හතක කාලයේ දී ධීවර කටයුතු තහනම් කරන ලදි. එයින් ලැබුන ප්‍රතිඵල මොන තරමටම සතුටු දයක වී ද දැනට මියයන කුරුල්ලන් සංඛ්‍යාව 20 දක්වා පහත වැටුණි. ඇන්ටාර්ටික් කලාපයේ ධීවර කටයුතු වෙනුවෙන් විශේෂ බලපත්‍ර ලබා දීම ද, ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ පැවැත්ම වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන වලින් ලද විශේෂ අනුග්‍රහ අතර වේ.

මේ අතර ඕස්ට්‍රේලියාව ඇල්බට්‍රොස් කුලයේ ම Petrels ( පෙට්‍රෙල්ස් ) කුරුලු විශේෂය වෙනුවෙන් ද ජාත්‍යන්තර ගිවිසුමක් පිළියෙළ කිරීමට කටයුතු යොද ඇත. කුරුලු ජීවී විශේෂ සඳහා වූ ආරක්ෂණ වැඩ පිළිවෙළ, දැනටමත්, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය ඇතුළුව බ්‍රසීලය, චිලී, ප්‍රංශය, පේරු, බ්‍රිතාන්‍යය සහ ස්පාඤ්ඤය ආදී රටවල අනුමැතිය ලබා ඇත. නමුත් විශාල පරිමාණයෙන් ධීවර කටයුතු සිදු කරන ජපානය මෙම ආරක්ෂණ ගිවිසුම වෙනුවෙන් එකඟ නොවීම ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ අනාගතයට එරෙහි වූ තර්ජනයක් නොවන්නේ ද? බ්‍රිතාන්‍ය රජකම හිමි චාල්ස් කුමරු සඳහන් කරන අන්දමට, අවුරුද්දක් පාසා ලක්ෂ තුනක් කුරුලු විශේෂ මරණයට පත් වනවා නම් ඔවුන් ගේ මෙම ශෝචනීය ඉරණමට එරෙහිව අපි නැගී සිටීමට දැන් කාලය එළැඹ ඇත.

ජාත්‍යන්තර ලෙසින් ඇල්බට්‍රොස් කුරුල්ලන් ගේ ජීවිත ආරක්ෂාවට නීතිරීති පැනවූවත් ධීවරයන් සිටින්නේ ගොඩබිම සිට බොහෝ ඈත ය. ඔවුන් තමන්ගේ මනාපය අනුව හිතුවක්කාරව කටයුතු කළොත් ඇල්බට්‍රොස් කුරුල්ලන්ගේ සුන්දර දර්ශණය අප වෙනුවෙන් මැවෙන්නට නම් ඉඩක් නැත.

ඇල්බට්‍රොස් කුරුල්ලන් පිළිබඳ ගෙතුන එක් ප්‍රබන්ධ කතාවකි මේ. 'මුහුදු ගමනේ යෙදුනු නාවිකයකු ඇල්බට්‍රොස් කුරුල්ලකු මරා මුහුදට දැම්මේ ය. එදා සිට මේ පුද්ගලයාට හැමතැනම වතුර දුටුව ද බිඳකිදු බොන්නට ලැබුනේ නැත. පරිසරයට සිදු කළ විපතට ආත්මය ඔහුට දඬුවම් කළේ එලෙස ය'.

❑

රීඩර්ස් ඩයජස්ට් ඇසුරෙනි.

**පුන්‍යා චාන්දනී ද සිල්වා**